අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය.

(1) උප්පැන්න සහතිකය
(2) අධ්‍යාපන සහතික
(3) පදිංචිය සනාථ කිරීමේ සහතිකය
(4) මෑතක දී ලබාගත් ග්‍රාම සේවා සහතිකය
(5) මෑතක දී ලබාගත් චරිත සහතික 02ක්
(6) වෙනත් සුදුසුකම් දක්වෙන සහතික
(7) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස් කර ඉල්ලුම් කරන තනතුරට අදාළ කවරයේ වම්පස ලියා 2017.11.06 වැනි දිනට පෙර ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී මහර ප්‍රාදේශීය සභාව පහල කරගහමුණ කඩවත යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දිනෙන් පසු ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්. ඒ. කේ. එන්. ඉන්ද්‍රජිත්,
ලේකම් හා සභාවේ බලතල කාර්ය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
මහර ප්‍රාදේශීය සභාව.

2017ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
මහර ප්‍රාදේශීය සභාව,
පහල කරගහමුණ.
කඩවත.

## මහර ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ..................................................... තනතුර සඳහා බඳවා ගැනීම

01. මුලකුරු සමග නම :——————————.
 මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
03. ස්ථිර ලිපිනය :——————————.
04. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
05. උපන් දිනය :——————————.
 2017.11.06 දිනට වයස :- අවුරුදු :———— මාස :———— දින :————
06. ජාතික හැඳුනුම්පත් අංකය :——————————
07. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද?/ලියාපදිංචි වීමෙන් ද?
08. දුරකථන අංකය :————
09. (i) අධ්‍යාපන සුදුසුකම් :——————————
 (ii) අ.පො.ස. (සා.පෙළ) :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

# තනතුරු - ඇබෑර්තු

## මහර ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මහර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට බස්නාහිර පළාත තුළ පදිංචි සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය (මාසිකව) | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහායක | 01 | රු. 24,250- 10x250- 10x270-10x300-12x330- රු. 36,410 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (05)ක් එකවර සමත් විය යුතු ය.) |
| 02 | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 01 | රු. 24,250- 10x250- 10x270-10x300-12x330- රු. 36,410 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතු ය. |

*බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(1) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(2) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචකරුවෙකු විය යුතුය.

(3) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බල නොපානු ඇත.)

(4) අයදුම්කරු තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(5) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවකු හෝ රජයේ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුය.

(6) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස්කම් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මහර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (එහෙත් මේ පිළිබඳ රජයේ ප්‍රතිපත්ති තීරණයට ඔබ යටත් විය යුතුය.)

(ii) පත්වීමේ දින සිට අවුරුදු තුනක පරිවාස කාලයට යටත් වේ.

(iii) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(iv) මෙම බඳවා ගැනීමේදී කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලට ද බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මහර ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

01. සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.

02. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

(iii) අ.පො.ස (උසස් පෙළ) :

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

(iv) වෙනත් සුදුසුකම් :

10. *සේවා පළපුරුද්ද :*

(i) දැනට දරන තනතුර :————————————.

(ii) එම තනතුරට පත් වූ දිනය :————————————.

(iii) එම තනතුරෙහි සේවා කාලය :————————————.

(iv) මීට පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුරු :————————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මවිසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව මා තෝරා ගැනීමට පෙර හෝ පසුව හෙළිවුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

..........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :..........................................

***දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ අත්සන***

මෙම ඉල්ලුම්කරු වන ..............................මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම කාර්යාලයේ .......................................... වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

..........................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :...........................

10-1055